## වැවිලි අමාත්‍යාංශය

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** - **තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී**

**කළමනාකරණ සහකාර(තාක්ෂණික)** MA 2-3 - III

**පත්වීමේ ස්වභාවය** - ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා දායකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරකි.

**සුදුසුකම්** - **(අ) බාහිර අයදුම්කරුවන්**

කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය හෝ වැවිලි ව්‍යාප්ති

කළමනාකරණය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත (අ) හි සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වැටුප් පරිමාණය** - මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016

අනුව 2016.01.01 දින සිට රු. 31,510-445X10-660X11-730X10-750X10= 58,020/- (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

මීට අමතරව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරඟ විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත පරීක්ෂණය සඳහා වූ ක්‍රමවේදය**

**ප්‍රශ්න පත්‍ර දෙකකි.**

(i) පත්‍රය : කාලය පැය 1 කි.

බහුවරණ ප්‍රශ්න 50 ක් අඩංගුය.

**විෂය නිර්දේශය :** සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කෘෂිකාර්මික සිද්ධාන්ත, තේ තාක්ෂණය, තේ කර්මාන්තයට අදාළ කරුණු

ලකුණු ප්‍රශ්න 50 X ලකුණු 2 බැගින් ලකුණු 100

(ii) පත්‍රය : කාලය පැය 1 ½ කි.

**විෂය නිර්දේශය :** කෘෂිකාර්මික මූලධර්ම, තේ අංශයට අදාළ කරුණු, තේ කර්මාන්තය හා තාක්ෂණය, කෘෂිකර්ම ව්‍යාප්තිය හා සන්නිවේදනය

**ප්‍රශ්න හා ලකුණු :**

(i) කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න

ඉන් 6 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 6 X ලකුණු 5- ලකුණු 30

(ii) කොටස

රචනාත්මක ප්‍රශ්න 7 කි.

ඉන් 5 කට පිළිතුරු අපේක්ෂා කෙරේ.

ප්‍රශ්න 5 X ලකුණු 14- ලකුණු 70

එකතුව ලකුණු 100

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් ලකුණු 40% ක්ද ප්‍රශ්න පත්‍ර 2 සඳහා එකතුව අවම වශයෙන් 50% ක්ද ලබාගත යුතුය.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| | |
|---|---|
| අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අමතර අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | ලකුණු100 |

ලිඛිත තරඟ විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් ගෙන කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කෙරේ.

**වයස** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්** - සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**අමතර ප්‍රතිලාභ** - නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර, අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3%ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

**අයදුම්පත්** - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද දක්වෙන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** - 2020 සැප්තැම්බර් මස 24 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2020.09.10)